# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 14 /2018

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2018 නොවැම්බර් මස 9 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**තේරීම් කමිටු සාමාජිකයන් සඳහා ගාස්තු ගෙවීම**

තේරීම් කමිටු සාමාජිකයින් සඳහා ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් 2011.03.18 දිනැතිව නිකුත් කර ඇති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 954 හි 3 වන ඡේදය සහ 2012.04.30 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 982 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන සහ විධායක තනතුරු සඳහා වන තේරීම් කමිටු සඳහා සහභාගී වන සාමාජිකයින් හට ගෙවනු ලබන ගෙවීම් අනුපාතයන් පහත සඳහන් පරිදි වැඩි කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2018.08.23 දින පැවති සිය 993 වන සභා වාරයේ දී තීරණය කර ඇත.

බාහිරව පත් කරනු ලබන සාමාජිකයින් (නම් කරන ලද) - රු.4000/- (අවම ගෙවීම)

නිල බලයෙන් පත් කරන ලද සාමාජිකයින් - රු.2000/- (අවම ගෙවීම)

**හෝ**

සම්මුඛ පරීක්ෂණයක දී එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් ලබාදෙන වැඩිම අගය රු.50/- වේ. රජයේ අනුමත ගාස්තු මත පදනම්ව ගමන් වියදම් ද ගෙවිය යුතුය.

3. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 954 හි අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතින අතර මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීම සමග අනෙකුත් කාර්ය මණ්ඩල තනතුරු සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 982 අදාල වේ.

4. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2018.12.03 දින සිට ක්‍රියාත්මක වේ.

5. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කළේ. **මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත් :

1. ලේකම්/ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්

5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

6. පීඨාධිපතිවරුන්

7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්

8. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්

10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්

11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්

12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්

13.අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්

15.උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්

16. වෘත්තීය සමිති ලේකම්වරුන්

17.විගණකාධිපති

ලිපි ගොනු අංක: යූජීසී/එච්ආර්/6/2/9